ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,069 - 2018 අප්‍රේල් මස 27 වැනි සිකුරාදා - 2018.04.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු- ඇබෑර්තු ... ... ... | 838 | පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — | අයවැය ලේඛන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 843 | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | 852 |


සැ. යු. -(i) ඉඩම් (සන්නකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත 2018 අප්‍රේල් මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2018 අප්‍රේල් මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 මැයි මස 18 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 මැයි මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### මීගමුව මහ නගර සභාව

මීගමුව මහා නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති වැඩ/ක්ෂේත්‍ර කම්කරු, මෝටර් විදුලි කාර්මික හා රියදුරු තනතුරු සඳහා විවෘතව බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත සම්පූර්ණ කර "නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මීගමුව" යන ලිපිනයට 2018.05.27 දිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *ශ්‍රේණිය* | *වැටුප් ක්‍රමය* |
|---|---|---|---|---|
| 01 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 02 | III | PL - 1 - 2016 (රා.ප.ච. 3/2016 අනුව)<br>රු. 24,250-10x250-10x270-10x300-12x330 - රු.36,410.00 වැටුප් පරිමාණයකි.<br>ආරම්භක වැටුප් පියවර රු. 24,250.00<br>4 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. |
| 02 | මෝටර් විදුලි කාර්මික | 01 | III | PL - 2 - 2016 (රා.ප.ච. 3/2016 අනුව)<br>රු. 25,250-10x270-10x300-10x330-12x350 - රු.38,450.00 වැටුප් පරිමාණයකි.<br>ආරම්භක වැටුප් පියවර රු. 25,250.00<br>4 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. |
| 03 | රියදුරු | 05 | III | PL - 3 - 2016 (රා.ප.ච. 3/2016 අනුව)<br>රු. 25,790-10x270-10x300-10x330-12x350 - රු.38,990.00 වැටුප් පරිමාණයකි.<br>ආරම්භක වැටුප් පියවර රු. 25,790.00<br>4 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. |

*වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් :-*

අධ්‍යාපන සුදුසුකම් : 8 වැනි ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතු ය.

කායික සුදුසුකම් : තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයන් යුක්ත විය යුතු ය.

බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය. (වසරකට ලකුණු 05 බැගින්) | 15 | 50% |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය. | 75 | |
| පෞරුෂත්වය | 05 | |
| මුළු ලකුණු | 100 | |

**සටහන** :- පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව පත්වීම් කරනු ලබන අතර, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකදී සලකා බලනු ලබන අවශ්‍යතාද මෙහිදී සලකා බලනු ලැබේ.

*මෝටර් විදුලි කාර්මික තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් :*

| | | |
|---|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | : | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම. (මින් විෂයයන් පහ (05) ක් එකවර සමත් විය යුතු ය.)<br>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 28/2016 අනුව වෘත්තීය සුදුසුකමක් ලෙස ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 සුදුසුකම ලබා තිබීම අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත්වීම හා සමාන කොට සැලකේ. |
| වෘත්තීය සුදුසුකම් | : | අදාළ තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන තිබීම හා අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ මාස 06 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.<br>(සහතික මගින් සනාථ කල යුතු ය.) |
| පළපුරුද්ද | : | අදාළ නොවේ. |
| රැකියා විස්තරය | : | සියළුම වාහනවල විදුලි පද්ධතියෙහි දෝෂ ඇතිවූ අවස්ථාවලදී එය හඳුනා ගැනීම හා අළුත්වැඩියා කිරීම. |
| කායික සුදුසුකම් | : | සෑම අයදුම්කරුවෙකුම බස්නාහිර පළාතේ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය. |
| බඳවා ගැනීමේ ක්‍රමය | : | මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදුකෙරේ. මෙහිදී ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ. |

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| *බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් :*<br>බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම ලෙස දක්වා ඇති අ.පො.ස. (සා.පෙළ) විභාග යේදී සාමාර්ථ ලබා ගෙන ඇති විෂයයන් හය හා සම්මාන දෙකට අමතරව සමත්ව ඇති විෂයයන් සඳහා ලබා ඇති සාමාර්ථ සඳහා විෂයයන් දෙක (02) ක උපරිමයකට යටත්ව ලකුණු ලබාදේ.<br>• සාමාන්‍ය සාමාර්ථයට ලකුණු - 04<br>• සම්මාන සාමාර්ථයට ලකුණු - 06<br>• අධි සම්මාන සාමාර්ථයට ලකුණු - 08<br>• විශිෂ්ට සම්මානයට ලකුණු - 10 | 20 | 50% |
| *සාමාන්‍ය දැනීම :*<br>ආර්ථික, සාමාජයීය, අධ්‍යාපන, විද්‍යාත්මක, සංස්කෘතික, දේශපාලනික මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ දේශීය, විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්න වලින් යුක්ත වේ. | 75 | |
| *පෞරුෂත්වය :*<br>සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලීම | 05 | |
| **මුළු ලකුණු** | 100 | |

***සටහන*** **:** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ.

*රියදුරු තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් :-*

අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම. (එක් වරක දී විෂයයන් පහක් (05) අවම වශයෙන් සමත්ව තිබිය යුතු ය.)

වෘත්තීය සුදුසුකම් :

1. පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන්වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදීවීමේ බලපත්‍රයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර තුනක (03) ට පෙර අවම වශයෙන් 'සී' සහ 'සී1' වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'බී' පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතු යි.)

2. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතු ය.

සංලක්ෂය : ආයතනයේ අවශ්‍යතාවය අනුව පවතින පුරප්පාඩු බර වාහන පැදවීමේ නිපුණතාව සහිත රියදුරන් ගෙන් පිරවීමට ඇති අවස්ථාවලදී බර වාහන රියදුරු බලපත්‍රය (තාර බර හොණ්ඩර් 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස්රථ සඳහා රියදුරු බලපත්‍රයක් එනම්, 'ඒ 1' සහ 'සී 1' පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'බී' සහ 'ඩී 1' පන්තියේ බලපත්‍රයත් නැතහොත් තාර බර හොණ්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 ට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාව පිළිබඳ සහතිකයක් හෝ 'ඒ' පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'ඩී' පන්තියේ බලපත්‍රයක්) මූලික සුදුසුකම වශයෙන් නියම කිරීමට පත්වීම් බලධරයා කටයුතු කරනු ඇත.

පළපුරුද්ද : බලබත්‍රය ලැබීමෙන් පසු රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතු ය. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතු යි.)

කායික සුදුසුකම් : අවම උස අඩි පහක් (5') විය යුතු ය.
දිවාකාලයේ හා රාත්‍රීකාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය. රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් ඒ බැව් සනාථ කළ යුතු ය.

බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් සමත් වන අයදුම්කරුවන් පුරුප්පාඩු අනුව බඳවාගනු ලැබේ.

වෘත්තීය පරීක්ෂණය :

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. රිය පැදවීමේ නිපුණත්වය | 40 | 20 |
| 2. මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | 20 |
| 3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | 10 |
| එකතුව | 100 | 50 |

ඉහත වෘත්තීය පරීක්ෂණය පත්වීම් බලධරයා විසින් පත්කරනු ලබන විධායක/මාණ්ඩලික නිලධාරියෙකු, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් රථ වාහන පරීක්ෂකයෙකු හා පොලිස් රථ වාහන අංශයේ නිලධරයෙකු මගින් පවත්වනු ලැබේ.

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

බඳවා ගැනීමේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පැවැත්වේ. ලකුණු ලබාදීමක් සිදු නොකෙරේ.

සියළුම තනතුරු සඳහා -

වෙනත් සුදුසුකම් :-

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු යි.
- අයදුම්කරු යහපත් චරිතයකින් යුක්ත විය යුතු යි.
- අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසාන දිනට අවම වශයෙන් වසර 03 ක් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය සනාථ කළ යුතු ය.
- තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට, එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

වයස :- අවම සීමාව - අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු යි.
උපරිම සීමාව - අවුරුදු 45 ට නොවැඩි විය යුතු යි.

(රියදුරු තනතුර සඳහා දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

තනතුරෙහි ස්වභාවය :- ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත ය.

භාෂා ප්‍රවීණතාවය :

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුනු සේවකයින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතු ය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රා.ප.ච. 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ විධිවිධානයන්ට අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය. |
| 3. සන්ධාන භාෂාව (අදාළ වන්නේ නම් පමණි) | අදාළ නොවේ. |

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :-

තෝරාගනු ලබන්නන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලටද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයටද, කලින් කළ බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලටද බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන නියෝගවලටද අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලටද ආයතන ප්‍රධානින් විසින් නිකුත් කරනු ලබන නියෝගවලටද අනුව කටයුතු කළ යුතු ය.

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ :-

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව/බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කෙරෙනු ඇත.

නාගරික කොමසාරිස් (රා. ඉ.)
මීගමුව.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**තනතුරු සඳහා අයදුම් පත්‍රය**

මීගමුව මහා නගර සභාව

1. මූලකුරු සමග නම :————————.
2. සම්පූර්ණ නම :————————.
3. ස්ත්‍රී/පුරුෂ භාවය :————————.
4. ජාතික හැඳුනුම්පත් අංකය :————————. දුරකතන අංකය :————————.
5. ඉල්ලුම් කරන තනතුර :————————.
6. ස්ථිර පදිංචි ලිපිනය :————————.
7. තැපැල් ලිපිනය :————————.
8. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————.
9. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :————————.
10. ස්ථිර පදිංචිය දරන පළාත් පාලන ආයතන බල ප්‍රදේශය :————————.
11. උපන් දිනය :————————.
12. 2018.05.27 දිනට වයස :————————.
13. අධ්‍යාපන සුදුසුකම් :————————. (ඡායා පිටපත් ඇමිණිය යුතු යි)
14. පළපුරුද්ද :————————. (රියදුරු තනතුර සඳහා ඡායා පිටපත් ඇමිණිය යුතු යි)
15. වෘත්තීය සුදුසුකම් :————————. (රියදුරු තනතුර සඳහා ඡායා පිටපත් ඇමිණිය යුතු යි)
16. වෙනත් සුදුසුකම් :————————.
17. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරු කර තිබේද යන වග :————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට නිවැරදි බව, ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සෙකු කිරීමට, බඳවා ගැනීමෙන් පසුව හෙළිදරව් වුවහොත් සේවයෙන් පහකිරීමටත්, යටත්වන බව හොඳාකාරවම දනිමි.

දිනය :——————.

......................,
අයදුම්කරුගේ අත්සන

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය.*

මෙම ඉල්ලුකරු වන ................................................. මහතා/මිය/මෙනෙවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ..................... ................................... වශයෙන් සේවය කරයි. මෙම තනතුරු සඳහා ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි ය./නොහැකි ය. ඔහු/ඇය කුමන ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කරමි./නොකරමි.

...........................
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————————.
තනතුර :————————.
දිනය :————————.

04-1020

# පළාත් පාලන නිවේදන

## යටිනුවර ප්‍රාදේශිය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශිය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් යටිනුවර ප්‍රාදේශිය සභාව සතු මංමාවත් වලින් කොටසක් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත් අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංන 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 24 (2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධතාවයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත්, යටිනුවර ප්‍රාදේශිය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ඩබ්ලිව්. ඒ. එල්. තුෂාරි ජයරත්න,
ලේකම්,
යටිනුවර ප්‍රදේශිය සභාව

යටිනුවර ප්‍රාදේශිය සභාව
ඇඹිල්මීගම,
පිළිමතලාව.

| *අනු අංකය* | *මාර්ගයේ නම* | *ග්‍රාම නිළධාරි වසම* | *පටන් ගන්නා ස්ථානය* | *අවසන් වන ස්ථානය* | *වම් පැත්ත* | *දකුණු පැත්ත* | *දිග* | *පළල* | *පිඹුරුපත් අංකය* |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | ෆාම් වත්ත පාර | පහළ මුදලිවත්ත | බහායි සෙන්ටර් සිට නාගහමුල දක්වා දිවෙන මාර්ග යේ පාලම අසල සිට | දුම්මලදෙණිය ඇල හරහා සුසාන භූමියට දිවෙන මාර්ගය | | ඩබ්ලිව් රත්නායක<br>අයි. පී. පියදාස<br>ඩී. ජී. චන්ද්‍රා ආරියලතා<br>ඩබ්ලිව් ඩී. ධම්මිකා හේමන්ති<br>අයි. පී. ප්‍රියන්ත ජයවර්ධන<br>ඒ. රණවීර<br>පී. එම්. ඉලංගකෝන්<br>ඊ. එන්. ජයතිලක | මීටර් 190.0 | මීටර් 2.43 | 3688 |

04-831

---

## කඹුරුපිටිය ප්‍රාදේශිය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 24 (1) (ආ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර දකුණු පලාත් සභාවේ මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය ප්‍රාදේශිය සභාව විසින් මෙකී පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් කඹුරුපිටිය ප්‍රාදේශිය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාරව පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් විසින් හෝ යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 24 (2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට දන්වන අතර, ඉදිරියේදී මෙම මාර්ගවලට අයත් ඉඩම්වලින් අදාල බිම් ප්‍රමාණය අත්පත් කර ගැනීමට කටයුතු යොදන බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධතාවයක් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත්, කඹුරුපිටිය ප්‍රාදේශිය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ලේකම්,
කඹුරුපිටිය ප්‍රාදේශිය සභාව.

**කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව මාර්ග ලියාපදිංචි කිරීම**

| පාරේ නම | ග්‍රාම නිලධාරි වසම | දෙපස ඇති ඉඩම් | | ආරම්භය | අවසානය | දුර මීටර් | පළල මීටර් |
|---|---|---|---|---|---|---|---|
| | | වම | දකුණ | | | | |
| දිවෙල්වත්ත පාර | 321 බී තුඹේ | කේ. කේ. සෝමාවතී පදිංචි ඉඩම<br><br>කරයැල් දෙනිය ශාන්ත අබේගුණවර්ධන යන අයට අයත් කරයැල් දෙනිය කුඹුර<br><br>එම්. කේ. අබේගුණවර්ධනට අයත් ගොරකගහවත්ත ඉඩම<br><br>එන්. ටී. අබේගුණවර්ධනට අයත් (කැබලි කල) ගොරොක්ගහවත්ත ඉඩම | එන්. ටී. අබේගුණවර්ධනට අයත් කරයැල් දෙනිය කුඹුර<br>එම්. කේ. අබේගුණවර්ධනට අයත් ගොරකගහ වත්ත ඉඩම<br><br>එන්. ටී. අබේගුණවර්ධනට අයත් (කැබලි කල) ගොරොක්ග හවත්ත ඉඩම | කඹුරුපිටිය කිරින්ද ප්‍රධාන මාර්ගය | ඩී. එන්. අබේගුණවර්ධනගේ නිවස | 340 | 06 |

අනුමත කරමි.

ලේකම්,
කඹුරුපිටිය ප්‍රාදේශිය සභාව.

04-833

---

## දඹුල්ල මහ නගර සභාව

### ඝන අපද්‍රව්‍ය කළමණාකරනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

### නිවේදනය

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව හා 252 වන අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 286 (අ) උපවගන්තිය ප්‍රකාරව පහත සඳහන් තීරණය මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. කේ. ආර්. බී. රත්නායක,
නාගරික කොමසාරිස්,
මහ නගර සභාව,
දඹුල්ල.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.08 දින 1816/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්ද වූ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මෙම තීරණය ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දිනයේ සිට දඹුල්ල මහ නගර සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට 252 වන අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 286 (අ) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් තීරණය කරමි.

04-856

---

**කෑගල්ල ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරන (අනුෂාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති CLG5/4/K/4 හා 2018.01.04 දිනැති ලිපිය අනුව පහත උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම මාවත් සළකුණු කරනු ලැබ ඇත්තේ යම් ඉඩමක් හරහාද එම ඉඩමේ අයිතිකරු ලෙස හිමිකම්පාන යම් පාර්ශවයක් වේ නම් මෙම දැන්වීම පල කළ දින සිට මාස 03 ක කාලයක් තුළ එම ඉඩමට ඇති අයිතිය ඔප්පු කිරීම සඳහා නිසි අධිකරණයෙහි නඩුවක් පවරා විරෝධතා ඉදිරිපත් කළ යුතු බව ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. ඒ. එස්. එම්. වික්‍රමසූරිය,
ලේකම්,
කෑගල්ල ප්‍රාදේශීය සභාව,
බුළුරුප්ප, හෙට්ටිමුල්ල.

2018 මාර්තු 21 දින.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| 01. පාරේ නම | :- | රඹුක්කන මාර්ගයේ පුවක්දෙනිය මාර්ගය ආරම්භ වන ස්ථානයේ සිට නිල්වක්ක මාර්ගය අවසන් වන ස්ථානය දක්වා |
| වසම | :- | පුවක්දෙනිය වසම හා දිඹුල්ගමුව වසම |
| දිග | :- | අඩි 8455 |
| පළල | :- | අඩි 12 |


| *වම්පස* | *දකුණුපස* |
|---|---|
| 01. පියසිරි - ඉඩම | 01. කුඹුරු - ඉඩම |
| 02. ගාමිණි - ඉඩම | 02. දිනේෂි ලසන්තා |
| 03. කේ. පී. විජේසේකර | 03. සුමනදාස - ඉඩම |
| 04. පන්සල් වත්ත - ඉඩම | 04. රාජරත්න - ඉඩම |
| 05. පන්සල් වත්ත කුඹුරු ඉඩම | 05. එච්. ඒ. පී. නිමල් කරුණාරත්න |
| 06. ඉහළවෙල ඇළ | 06. යූ. ප්‍රේමදාස |
| 07. ඩබ්. එස්. ඒ. ඩබ්. කේ. ධර්මසේන | 07. යූ. පී. කුමාරි |
| 08. යූ. කරුණාවතී | 08. ඩබ්. එස්. ඒ. ඩබ්. කේ. ධර්මසේන |
| 09. සිරිසේන - ඉඩම | 09. ශ්‍රියානි විජයන්ති |
| 10. දීප්ති - ඉඩම | 10. ඩබ්. එස්. ඒ. ඩබ්. කේ. ධර්මසේන |

*වම්පස*


11. පියසිරි - ඉඩම
12. නිමල් කරුණාරත්න
13. ධර්මසේන - ඉඩම
14. ගුණරත්න - ඉඩම
15. ගුණසේන - ඉඩම
16. සෝමපාල - ඉඩම
17. චන්ද්‍රා - ඉඩම
18. රණසිංහ - ඉඩම
19. චන්ද්‍රාවතී - ඉඩම
20. රණසිංහ - ඉඩම
21. ගුණතිලක - ඉඩම
22. නිව්ටන් - ඉඩම
23. වීරසිංහ - ඉඩම
24. කමලාවතී - ඉඩම
25. ආනන්ද, නිව්ටන් - ඉඩම
26. සෝමරත්න - ඉඩම
27. ගුණපාල - ඉඩම
28. මාලනී ඒකනායක
29. ඩබ්. වික්‍රමසිංහ
30. එච්. තිලකරත්න
31. එච්. සෝමපාල
32. දයාවංශ - ඉඩම
33. නීල් විජේසිංහ
34. විජේසිංහ - ඉඩම
35. ධර්මසේන - ඉඩම
36. තිලකරත්න - ඉඩම
37. ගුණතිලක - ඉඩම
38. පියසිරි - ඉඩම
39. එච්. විජේසිංහ
40. තිලකරත්න - ඉඩම
41. විජේරත්න - ඉඩම
42. විජේසිංහ - ඉඩම
43. වික්‍රමසිංහ - ඉඩම
44. ජයතිලක - ඉඩම
45. එරංග - ඉඩම
46. බස්තියර් - ඉඩම
47. පී. එම්. ඩී. ප්‍රේමරත්න
48. එස්. විජේසිංහ - කුඹුරු ඉඩම
49. ඩබ්. පී. රූපසිංහ
50. එස්. විජේසිංහ
51. සමන්තිලක - ඉඩම
52. විජේසිංහ - ඉඩම
53. එච්. ප්‍රියසිරි - ඉඩම
54. ගුණතිලක - ඉඩම
55. විජේරත්න - ඉඩම
56. පොඩිමැණිකේ - ඉඩම
57. අලහකෝන් - ඉඩම
58. බණ්ඩාරනායක - ඉඩම
59. රත්නායක - ඉඩම
60. සමරකෝන් - ඉඩම


*දකුණු පස*


11. රංජිත් රූපසිංහ
12. ප්‍රේමාවතී - ඉඩම
13. තිලක් ජයවර්ධන
14. චන්ද්‍රලතා - ඉඩම
15. ගුණරත්න - ඉඩම
16. වික්‍රමනායක - ඉඩම
17. පරිණාමකය (ට්‍රාන්ස්පෝමර්)
18. දිලාන් - ඉඩම
19. පත්මාවතී - ඉඩම
20. රණසිංහ - ඉඩම
21. දිඹුල්ගමුව පාසල
22. නිමල් චන්ද්‍රමාන
23. කරුණාරත්න - ඉඩම
24. නිව්ටන් - ඉඩම
25. ලක්ෂ්මන් - ඉඩම
26. ආර්. පී. ජයවර්ධන
27. සරත් කුමාරසිංහ
28. කරුණා ජයසිංහ
29. ඉලංගරත්න - ඉඩම
30. එච්. තිලකරත්න
31. එස්. සරත්
32. සරත් කුමාරසිංහ
33. නීල් විජේසිංහ
34. ගුණතිලක - ඉඩම
35. කරුණාරත්න - ඉඩම
36. සරත් - ඉඩම
37. තිලකරත්න - ඉඩම
38. ජනක - ඉඩම
39. අජිත් කුමාර
40. ඩබ්. පී. විජේසිංහ
41. ආර්. එච්. ආර්. පුංචිඅප්පුහාමි
42. චන්ද්‍රාවතී මැණිකේ
43. එන්. එච්. ගුණතිලක
44. මංගලා - ඉඩම
45. පුවක්දෙණිය - ඉඩම




P.P.C. Jayasena (MSI)
Licensed Surveyor , Leveller
& Court Commissioner
Higgoda
Undugoda
Telephone No: 035-2278728
LSC Reg. No. 19991017
Plan No :- 2634
Section 1 of 5 Sections
see section 2
From Kegalle Road(H)
To Hiriwadunna
Paddy
Land of Piyasiri
Land of Dineshi Lasantha
Road
Land of Sumanadasa
Land of Gamini
Land of Rajarathne
Land of K.P Wijesekara
Paddy
Road
Land of Pansalewaththa
Paddy Land of Temple
Land of H.P.A Nimal Karunarathne
To Deldeniya
Ihalawela Ela
Land of W.S.A.W.K. Dharmasena
Land of U.Pemadasa
Land of U.P Kumari
Land of W.S.A.W.K. Dharmasena
Scale :- 1:2000
PLAN
Shown ,Puwakdeniya - Dimbulgamuwa Road
Situated at Puwakdeniya & Dimbulgamuwa Villages
( in No 14 A Puwakdeniya GS Division
within the Pradeseeya Sabha Area of Kegalla) in
Deyaladahamunu Paththu of Kinigoda Korale
Kegalle District
SABARAGAMUWA PROVINCE


Section 2 of 5 Sections
Plan No :- 2634
Scale :- 1:2000
From Deldeniya
Land of Dharmasena
Land of Piyasiri
Land of Gunarathne
Land of Gunasena
Land of Somapala
Road
Land of Chandra
Land of Ranasinghe
Land of Chandrawathi
Land of Ranasinghe
Land of Gunathilaka
Road
Land of Newton
Land of Newton
See Section 3
Land of Nimal Chandramana
Dimbulgamuwa School
Land of Ranasinghe
Land of Padmawathi
Land of Dilan
Transformer
Land of Ranjith Rupasinghe
Land of Wickramanayake
Land of Gunarathne
Land of Chandralatha
Land of Nimal Karunarathne
Land of Piyasiri
Land of Deepthi
Road
Land of Thilak Jayawardane
Land of Pemawathie
Land of Ranjith Rupasinghe
Land of Sirisena
Land of U.Karunawathie
Land of W.S.A.W.K. Dharmasena
Land of Sriyani Wijayanthi
Land of W.S.A.W.K. Dharmasena
see section 1


See Section 2
Section 3 of 5 Sections
Plan No :- 2634
Scale :- 1:2000
Land of Nimal Chandramana
Land of Karaunarathne
Land of Newton
Land of Newton
Land of Gunathilaka
Land of Lakshman
Land of Weerasinghe
Land of Kamalawathie
Land of R.P Jayawardena
Land of Ananda
Land of Newton
Road
Land of Newton
Land of Sarath Kumarasinghe
Land of Somarathne
Land of Gunapala
Land of Karuna Jayasinghe
Land of Malani Ekanayaka
Land of Ilangarathne
Land of W.Wickramasinghe
Road
Land of H.Thilakarathne
Land of H.Thilakarathne
Land of H.Somapala
Land of H.Sarath
Road
Road
Land of Dayawansa
Land of Sarath Kumarasinghe
Land of Neel Wijesinghe
Land of Neel Wijesinghe
Land of Wijesinghe
Road
Land of Neel Wijesinghe
Road
Land of Dharmasena
Land of Gunathilaka
Land of Thilakarathne
See Section 4
සැබෑ පිටපතකි.
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව


See Section 3
Section 4 of 5 Sections
Plan No :- 2634
Scale :- 1:2000
Land of Gunathilaka
Land of Thilakarathne
Land of Gunathilaka
Land of Karunarathne
Road
Road
Land of Piyasiri
Land of Sarath
Land of H.Wijesinghe
Land of Thilakarathne
Land of Thilakarathne
Land of Janaka
Land of Wijerathne
Road
Land of Ajith Kumara
Land of Wijesinghe
Land of W.P Wijesinghe
Land of Wickramasinghe
Road
Land of Jayathilaka
Land of R.H.R Punchi Appuhami
Road
Land of Eranga
Land of Chandrawathi Menike
Land of Basthiyar
Road
Land of P.M.D Pemarathne & Others
Road
Paddy of S.Wijesinghe
Land of W.P Rupasinghe
Land of N.H.Gunathilaka
Land of S.Wijesinghe
Land of Saman Thilaka
Land of Mangala
Land of Wijesinghe
Land of H.Piyasiri
සැබෑ පිටපතකි.
From Mangala's Houses
Road
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව
Land of Gunathilaka
From Puwakdeniya
Puwakdeniya Village
See Section 5


Section 5 of 5 Sections
Plan No :- 2634
Scale :- 1:2000
Sections 1-5
Licensed Surveyor
P. P. C. Jayasena
Licensed Surveyor
Leveller & Court Commissioner
Reg. No. 19991017
From Regalle Road(H) To Rambukkana
Land of Wijerathna
Land of Samarakoon
Land of Bandaranayaka
Land of Rathnayaka
Land of Wijerathne
Land of Bandaranayaka
Road
Land of Alahakoon
Road
Road
Road
Land of Podimenike
Land of Wijerathne
Ela
Land of Gunathilaka
See Section 4
Puwakdeniya Village
Length of the Road 2600.00M 8320ft.
Width of Road 3.75 M 12ft.
Date of Survey:- 2018.02.05,2018.02.12

# විවිධ දැන්වීම්

## කටුවන ප්‍රාදේශීය සභාව

### 2018 වර්ෂයට ආදහනාගාරය පාවිච්චි කිරීම සඳහා ගාස්තු පැනවීම

කටුවන ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයට ආදහනාගාරය පාවිච්චි කිරීම සඳහා ගාස්තු පැනවීමේ යෝජනාව 2018 මාර්තු මස 02 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අංක 14 යටතේ ලද නිර්දේශයට අනුව තීරණ අංක 532 යටතේ එම නිර්දේශය මා විසින් අනුමත කරන ලද බව නිවේදනය කරමි.

ඩබ්. කේ. සුරංග,
ලේකම්,
කටුවන ප්‍රාදේශීය සභාව.

2018 මාර්තු මස 02 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

#### යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (I) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (i) උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.05.17 වැනි දින අංක 1811 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්ද වූ ද, දකුණු පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලද බව 2014.08.29 වැනි දින අංක 1878 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්ද වූ සම්මත අතුරු ව්‍යවස්ථාවල අංක xxiii වැනි කොටස ආදහනා - ගාර විධිමත් කිරීම පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ඇතුළත් යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරන දින සිට පිළිගෙන ක්‍රියාත්මක කිරීමට කටුවන ප්‍රාදේශීය සභාව විසින් 2015 ජූලි මස 17 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ දී අංක 09 යටතේ ලද නිර්දේශයට අනුව තීරණ අංක 26 යටතේ එම නිර්දේශය අනුමත කර 2016 දෙසැම්බර් මස 02 වන දිනැති අංක 1996 දරන *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ කර ප්‍රකාශයට පත් කර ඇත.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09(03) උපවගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයට කටුවන ප්‍රාදේශීය සභාව සතු ආදහනාගාරය වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු පනවා අය කිරීමට කටුවන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

#### *උපලේඛනය*

| | | |
|---|---|---|
| 1. | කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවකුගේ දේහයක් ආදහනය කිරීම සඳහා | රු. 6,500 |
| 2. | කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය පිටත පදිංචිකරුවකුගේ දේහය් ආදහනය කිරීම සඳහා | රු. 7,500 |

04 - 847

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.